7th International Conference of Multidisciplinary Approaches (iCMA), 2020
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka.
ISSN: 2386 – 1509
Copyright © iCMA


# ශ්‍රී ලංකාවේ කෞතුකාගාර පද්ධතිය ආශ්‍රිත ව කෞතුක භාණ්ඩ අනුරූ අලෙවිසැල් ප්‍රවර්ධනය කිරිම සම්බන්ධ අධ්‍යයනයක්

දිසානායක ඩී.එම්.කේ.ජී.කේ.[1]*, ගනේආරච්චිගේ ඒ.එන්.එස්.[2],
අභයසුන්දර පී.එන්.[2] සහ විතානගේ ඩබ්ලිව්.කේ.එම්.[2,3]

[1]ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
[2]මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
[3]පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
kaushdizz@gmail.com

**සාරසංක්ෂේපය**

මානවයා අතීතයේ පටන් කුතුහලය මත පදනම් ව පෞරාණික භාණ්ඩ තමන් සතු කොට ගෙන, ඒවා ප්‍රදර්ශනය කිරීමෙන් තෘප්තියක් ලබා ගත්තේ ය. මෙම මානව චර්යාව වර්තමානයට ද පොදු වන අතර මුල් කෞතුක භාණ්ඩ ලබා ගත නො හැකි අවස්ථාවල දී එයට සමාන අනුරුවක් හෝ තමන් සතු කොට ගෙන ප්‍රදර්ශනය කිරීමට පෙලඹී සිටියි. අන්තර්ජාලයේ දියුණුවත් සමඟ කෞතුකාගාර අද වන විට ගතානුගතිකභාවයෙන් නිදහස් වී ඇති අතර තාක්ෂණය සමඟ මුසු වෙමින් ජනතාව වෙත වඩාත් සමීප වී ඇති නිසා කෞතුකාගාරවල ඇති නිෂ්පාදන, වෙනත් සංස්කෘතික අලෙවිකරණ උපායමාර්ග සමඟ, සේවා කළමනාකරණ මට්ටම පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කර ඇත. මේ තත්ත්වය යටතේ කෞතුකාගාර තමන් සතු කෞතුක භාණ්ඩවල අනුරූ තනවා සංචාරකයන්ට මිලට ගැනීමට ඉඩ සලසා දී ඇත. මෙමඟින් ලාභය අරමුණු කර නො ගත්, සමාජ සුබසාධනය සඳහා කැප වූ කෞතුකාගාරයන්ට මූල්‍යමය පිටිවහලක් සපයන අතර කෞතුක අනුරූ ජාත්‍යන්තරයට මුදා හැරීමෙන් මුල් කෞතුක භාණ්ඩය පිළිබඳ ව දැනුමක් හා ප්‍රචාරණයක් ද වක්‍රාකාර ව ලබා දේ. ගෝලීය කෞතුකාගාරවල කෞතුකාගාර අලෙවිසැල්වල මාර්ගගත විකුණුම් විමසා බැලීමේ දී එම කෞතුකාගාරවල ආභරණ නිෂ්පාදන අංශයට ප්‍රමුඛ ස්ථානයක් වෙන් කොට ඇත. ශ්‍රී ලංකාවේ ද මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ බටලීයේ ඇති අනුරූ පාසල මඟින් මෙරටට අවශ්‍ය අනුරූ නිෂ්පාදනය කරන නමුත් කෞතුක ආභරණ අනුරූ නිෂ්පාදනයට තවමත් නැඹුරු වී නොමැති බව දක්නට ලැබේ. මෙම අධ්‍යයනයේ දී ශ්‍රී ලංකාවේ කෞතුකාගාර අලෙවිසැල්වල වර්තමාන තත්ත්වය සාකච්ඡා කොට එය නගා සිටුවීමේ වැදගත්කම පිළිබඳ ව අවධානය යොමු කෙරේ. ඊට අමතර ව ගෝලීය ප්‍රවණතාවයක් වන කෞතුක ආභරණ නිෂ්පාදනය කෙරෙහි රාජ්‍ය අවධානයක් ලබා දීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් සාකච්ඡා කරනු ලැබේ. අධ්‍යයනය සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලේ බටලීය අනුරූ පාසලේ නිලධාරි මහතුන්ගෙන් සම්මුඛ සාකච්ඡාවන් සහ ලෝකයේ කෞතුකාගාර වර්ගීකරණය යටතේ ප්‍රමුඛස්ථානය ගනු ලබන ප්‍රංශයේ ලූවර් කෞතුකාගාරයේ ඇති මාර්ගගත වෙළෙඳපොළ වෙබ් අඩවිය සමඟ ශ්‍රී ලංකාවේ ඇති එක ම රාජ්‍ය මට්ටමේ කෞතුක අනුරූ මාර්ගගත වෙළඳපොළ වන මධ්‍යම සංස්කෘතික අරමුදල වෙබ් පිටුවෙහි අන්තර්ගත මාර්ගගත වෙළඳපොළ සැසඳීම මෙම පර්යේෂණයේ ප්‍රධාන ක්‍රමවේදය වී ය. මීට අමතර ව කෞතුක අනුරූ නිර්මාණය පිළිබඳ ව අවශ්‍ය තොරතුරු අධ්‍යයනය කිරීම සඳහා සාහිත්‍යය මූලාශ්‍ර අධ්‍යයනයක් සිදු කරන ලදි.

***ප්‍රමුඛ පද:*** කෞතුකාගාර සාප්පු, ඊ-වෙළඳපොළ, එම්-වෙළඳපොළ, කෞතුකාගාර විද්‍යාව